# ශ්‍රී ලාංකේය මූල ඓතිහාසික මහා ශිලා සුසාන සංස්කෘතිය පිළිබඳ හැඳින්වීමක්

ගල්වැවේ විමලඛන්ති හිමි

ප්‍රාග් ඓතිහාසික මානවයා දඩයමින් ගෙවන ලද ජීවිතයෙන් මිදී ජනාවාස වීමට මූලික අඩිතාලම දැමූ කාලපරිච්ඡේදය ''මූල ඓතිහාසික යුගය'' ලෙස ඉතා සරලව හඳුන්වා දිය හැකි ය. පාෂාණ යුගයේ අවසාන අවධියත්, ඓතිහාසික යුගයේ ආර්ම්භක අවධියත් අතර ඇති වූ සංක්‍රාන්තික අවධිය මූල ඓතිහාසික අවධිය ලෙස බොහෝ විචාරකයෝ හඳුන්වා දෙති. මෙම මූල ඓතිහාසික අවධිය ''මෙගලිතික් සංස්කෘතික'' (Megalithic Culture) අවධිය ලෙස ද හැඳින්වේ. මෙය ම ''මූල ඓතිහාසික යකඩ යුගය'' වශයෙන් දැරණියගල හඳුන්වන අතර මෙම යුගයේ ශ්‍රී ලංකාවේ සකපෝරුව භාවිතයෙන් කළු රතු මැටි බඳුන් සකස් කිරීමෙහි යෙදී සිටි දියුණු ජනතාවක් පිළිබඳව සාධක ලැබෙන බව එතුමා පෙන්වා දෙයි.

[1]මෙගලිතික යන වචනය 'මෙගස්' - විශාල, 'ලිතොස්' - ගල් යන වදනින් ප්‍රභවය වී ඇත. ශ්‍රී ලංකාවේ මෙම යුගය ක්‍රිස්තු පූර්ව 800-500 ට වැටෙන බව ද, සකපෝරුව භාවිතයෙන් වලං නිෂ්පාදනය කිරීම (ප්‍රධාන වශයෙන් කළු රතු මැටි බඳුන්) යකඩ තාක්ෂණය භාවිත කිරීම, ගොයම් වගාව, අශ්වයා හා ගවයා ගෘහාශ්‍රිතකරණය කරගෙන සිටීම මෙම යුගයේ ප්‍රධාන ලක්ෂණන් වශයෙන් දැරණියගල පෙන්වා දෙයි.[2]

වඩාත් පුළුල්ව මේ පිළිබඳ පර්යේෂණය කළ උගතුන්ගේ නිගමනය වන්නේ ක්‍රිස්තු පූර්ව 1200-1000 යුගයේ මහා ශිලා



සුසාන හා කාල රක්ත වර්ණ මැටි බඳුන් භාවිත කළ යුගය අර්ධද්වීපික ඉන්දියාවේ පාෂාණ යුගයන් අතරට ගැනෙන උප සංස්කෘතියක් වශයෙන් සැලකිය හැකි බව යි.[3] මෙකී ලක්ෂණ සහිත සංස්කෘතියක් ක්‍රිස්තු පූර්ව 1000 දී පමණ ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් බව ද, එය පුළුල් ඉන්දීය සංස්කෘතික සංකීර්ණයක වඩා ම දකුණින් පිහිටි කොටස වූ බව ද හඳුනාගෙන තිබේ.[4] මෙම මතයට පර්යේෂකයන් එළඹ ඇත්තේ දකුණු ඉන්දීය මෙගලිතික සංස්කෘතිය සමග ශ්‍රී ලංකාවේ මෙගලිතික සංස්කෘතිය බෙහෙවින් ගැලපෙන බැවිනි. මෙම අදහස් සෙනෙවිරත්න ශ්‍රී ලාංකේය ලෝහ තාක්ෂණයේ ආරම්භය සම්බන්ධයෙන් දක්වන අදහස් හා බෙහෙවින් ගැලපේ. ඒ අනුව දකුණු ඉන්දීය මෙගලිතික සංස්කෘතික ලක්ෂණ සමග ශ්‍රී ලංකේය මෙගලිතික සංස්කෘතික ලක්ෂණයන් බෙහෙවින් සමගාමී වේ.[5] මෙම අදහස උගතුන්ගේ සාකච්ඡාවට පත් වූ අතර කෘෂිකර්මාන්තය පිළිබඳ අවබෝධය හා ඒ තුළින් ජීවනෝපාය ප්‍රධාන වශයෙන් සලසා ගැනීම පිළිබඳ ඔවුන්ගේ දැනුම මෙම යුගයේ යකඩ තාක්ෂණයේ වඩා වර්ධනයට හේතු වූ බවට ඉන්දීය හා ශ්‍රී ලාංකීය උභය සන්දර්භයන් තුළින් ම ප්‍රකට වීම කාගේත් අවධානයට ලක්විය. මේ නිසාම දකුණු ඉන්දීය හා ශ්‍රී ලාංකීය මෙගලිකිත සංස්කෘතික ලක්ෂණයන්හි සම විෂමතා අධ්‍යයනයට උගතුන් පෙළඹී තිබේ. ගොවිතැන, සතුන් හීලෑ කිරීම, අශ්වයන් ඇති කිරීම, යකඩ හා තඹ මුල් කරගත් කුඩා ප්‍රමාණයේ ලෝහ කර්මාන්ත, පබළු නිෂ්පාදනය, ගැමි ජනපද, මහා ශිලා සුසාන භූමි පිළිවෙත්, කළු හා රතු භාණ්ඩ හා කළු භාණ්ඩ නිපදවීම සම්බන්ධ පිඟන් මැටි කර්මාන්තය, පිළිස්සීමෙන් පසු මැටි බඳුන්වල කුරුටු සලකුණු දැමීම යන මේ සියල්ල දකුණු ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට ගෙනෙන ලද බව කියනු ලැබේ.[6] එහෙත් දැරණියගල ඉන්දියානු අර්ධද්වීපීය හා ශ්‍රී ලාංකීය මෙගලිතික සංස්කෘතික අනුබද්ධිතතාවයක් පිළිබඳ අදහසට අනුකූලතාවයක් දක්වන්නේ නැත.[7] සංස්කෘතික ප්‍රයාණය පිළිබඳ සංකල්පය කෙසේ වුව ද මෙගලිතික සුසාන සංස්කෘතියේ මෙකී කුශලතාවයන් මෙරටින් ක්‍රිස්තු පූර්ව 1200 සිට දක්නට ලැබීම ශුෂ්ක කලාපීය ගවේෂණ කාර්යයන්හි දී වැඩි

වශයෙන් සාකච්ඡාවට බඳුන් වන කරුණක් බව සඳහන් කළ හැකි ය.

මෙම යුගය පිළිබඳ ලිඛිත සාධක නොමැති අතර එය හැදෑරීමට ඇත්තේ පුරාවිද්‍යාත්මක සාධක පමණි. ශ්‍රී ලංකාවේ මානවයා සංවිධානාත්මකව ජනාවාස පිහිටුවා ගැනීමට බලපෑ මූලික සාධකයන් මෙම කාලපරිච්ඡේදයේ දී හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ මූල ඓතිහාසික කාල පරිච්ඡේදය පිළිබඳව අධ්‍යයනයේදී පහත සඳහන් ප්‍රධාන පැතිකඩ කිහිපයක් ඔස්සේ තොරතුරු අනාවරණය කර ගත හැකි ය.

එනම්

1. සංවිධානාත්මක දඩයම
2. සීමිත කෘෂිකර්මාන්තය
3. සත්ත්ව පාලනය (ගෘහාශ්‍රිතකරණය)
4. සීමිත ධීවර කර්මාන්තය
5. ශිල්පීය භාණ්ඩ නිෂ්පාදනය[8]

යන අංශ වැදගත් වේ.

මේ හරුණු විට සංස්කෘතික හා මානව ක්‍රියාකාරකම් රාශියක් ද මෙම සංස්කෘතිය පදනම් කරගෙන ඇති වූ බව පෙනේ.

1. සුළු වාරි මාර්ග හා කෘෂිකර්මාන්තයේ සංවර්ධනය
2. යකඩ භාවිතය හා තාක්ෂනයේ දියුණුව
3. විශේෂ මැටි බඳුන් තාක්ෂණය
4. මුල් යුගයේ ජනාවාසවලට වඩා දියුණු ජනාවාස බිහිවීම
5. සුසාන භූමි ගොඩ නැගීම[9]

වශයෙන් එකී කරුණු පිඬු කොට දැක්විය හැකි ය.

ඒ අනුව මෙගලිතික ජනාවාස ව්‍යාප්තිය සඳහා ප්‍රදේශ තෝරා ගැනීමේදී තමන්ට අවශ්‍ය සම්පත් සොයාගත හැකි ප්‍රදේශ වෙත සංක්‍රමණය වූ බව පුරාවිද්‍යාඥයෝ පෙන්වා දෙති.[10]

16 OCT 2017



ඒ අනුව කෘෂිකාර්මික කටයුතු හා සත්ව පාලනය සඳහා වියළි දේශගුණයක් සහිත තැනිතාලා භූමිත්, ධීවර හා සාගර සම්පත් සඳහා වෙරළබඩ ප්‍රදේශයත්, ඛනිජ සම්පත් හා කුළුබඩු සඳහා කඳුකර ප්‍රදේශත් මෙම අවධියේ ජනතාව තෝරාගත් බව පැහැදිලි වේ.[11]

මූල ඓතිහාසික යුගයේ ජනාවස ව්‍යාප්තිය ප්‍රධාන වශයෙන්ම වියළි කලාපය ආශ්‍රිත ජල මූලාශ්‍රයයන් සමීපයේ පිහිටා තිබෙන අයුරු නිරීක්ෂණය කළ හැකිය. ප්‍රාග් ඓතිහාසික සමයේ ජනාවාස අඩුවීමත් අවශ්‍යතා සීමිත වීමත් මත සම්පත් ප්‍රමාණවත් වන්නට ඇත. මූල ඓතිහාසික අවධිය වන විට ජනගහනයේ වර්ධනයත් සමඟ පාරිසරික සම්පත් පරිභෝජනය වැඩි වන්නට ඇත. ජනගහණයට සාපේක්ෂව ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය වේගවත් කිරීමට සිදුවීම තුළ අමතර යැපුම් ක්‍රමයට යොමු වීමට සිදුවිය. මේ නිසා ශාක සහ සත්ත්ව ගෘහාශ්‍රිතකරණයට යොමු විය. තාක්ෂණික විපර්යාසයන් සිදුවන මෙම අවධිය තුළ ප්‍රාථමික ජල කළමනාකරණය දියුණු මට්ටමේ පැවැති බවට අනුරාධපුර ඇතුල් නුවර කැණීම්වලින් ලද සාධක තුළින් අනාවරණය වේ. ස්වාභාවික ජල මූල සිඳී යන හෙයින් අවශ්‍ය කරන ජලය රඳවා ගැනීමට වේලි බැඳ කුඩා වැව් සකස් කිරීම ද මේ අවධියේදී සිදුවිය. ප්‍රාථමික යකඩ යුගයේ හඳුනාගත හැකි තවත් ලක්ෂණයක් වන්නේ කාලරක්ත වර්ණ මැටි බඳුන් නිෂ්පාදනය යි. ඇතුළත කළු හා පිටත රතු පැහැයෙන් යුක්ත වන මේවාට පිළිස්සීමේ විශේෂ ක්‍රමයක් යොදාගෙන ඇත. මීට අමතර රක්ත වර්ණ මැටි බඳුන් හා කාල වර්ණ මැටි බඳුන් ද දක්නට ලැබේ. සුසාන චාරිත්‍රවලදී යොදා ගන්නා බරණි ද කැපී පෙනේ. පොම්පරිප්පුවෙන් සොයාගත් බරණිවල පිළිස්සී ගිය කුරුටු සටහන් යොදා තිබූ බවට සාධක අනාවරණය වන අතර ඒවා යම්කිසි සංකේත ක්‍රමයක් භාවිත කළ බවට ඇති සාක්ෂි බව පුරාවිද්‍යාඥයන්ගේ අදහස යි. රන්, රිදී හා තඹ උපයෝගි කර ගනිමින් පබළු හා තඹකුරු නිෂ්පාදනය කළ බවට සාධක හමුවේ. මැටි, ඛනිජ යනාදී ද්‍රව්‍ය මගින් පබළු නිෂ්පාදන ක්‍රමවේද මේ යුගයේ පැවැති බවට සාධක ඉබ්බන්කටුව, කොක්වෙලිය වැනි මෙගලිතික සුසානවලින් අනාවරණය වේ.

මෙම අවධිය තුළ ජීවත් වූ මිනිසුන් භාවිත කළ සුසාන ක්‍රම කීපයක් පිළිබඳව තොරතුරු අනාවරණය වී තිබේ. මේ අනුව බරණි සුසාන ක්‍රමය අනුව පොළවේ වළක විශාල බරණි තබා එහි කුඩා බඳුන් තුළ භෂ්මාවශේෂ හා අනෙකුත් ද්‍රව්‍ය තැන්පත් කර හතරැස් හෝ කවාකාර පියන් ගලකින් ආවරණය කරයි. පොම්පරිප්පුව ආශ්‍රිත මෙවැනි සුසාන 14 ක් පමණ සොයාගෙන ඇත.

මඤ්ජුසා (sist) සුසාන ක්‍රමය අනුව භෂ්මාවශේෂ බහාලන බඳුන් හා අනෙකුත් ද්‍රව්‍ය තැන්පත් කොට ගල් පතුරු සතරක් සතර පැත්තෙන් තබා ඊට ඉහළින් පැතලි ගලක් තබා ආවරණය කිරීම මෙවැනි සුසානවල ලක්ෂණය යි. මෙැවින් සුසාන ලංකාවේ බොහෝ ප්‍රදේශවලින් හමුවී තිබේ. මෙම ක්‍රමය වඩාත් ජනප්‍රිය ක්‍රමය වශයෙන් හඳුන්වා දිය හැකි ය. මෙවැනි සුසාන ඉබ්බන්කටුව, පිංවැව, මච්චාගම, ගුරු ගල්හින්න, තම්මැන්නා ගොඩැල්ල, රාජාංගනය, කිඹුල්වැව ආදී බොහෝ ප්‍රදේශවලින් හමු වේ. වළ ක්‍රමය මඟින් මියගිය පුද්ගලයාගේ අවශේෂ සහිත කුඩා බඳුනක් හෝ කිහිපයක් වළක් තුළ තැන්පත් කර විශාල ගල් පතුරකින් ආවරණය කරයි. ගල්මැස්ස (dolmen) වර්ගයේ සුසාන තවත් වර්ගයකි. පදවිගම්පොල ශිලා මංචකය වශයෙන් හඳුන්වන නිර්මාණය ශ්‍රී ලංකාවෙන් මේ සඳහා පෙන්වා දිය හැකි එක් සාධකයෙකි. සුසාන ක්‍රමය සහ මිනිස් අවශේෂ සමග මුට්ටි වළලා ඒ මත රළු සෙල් කණුවක් සිටුවා තැබීමේ ක්‍රමය (Alignment) වශයෙන් ද, සකොපාගුස් (Sacofarguse) ක්‍රමය හෙවත් විවිධ සතුන්ගේ රූ ආකාරයෙන් මැටියෙන් සාදා පිළිස්සූ බරණි තුළ භෂ්මාවහේෂ තැන්පත් කිරීමේ ක්‍රමය ද බොහෝ විට දක්නට ලැබේ. මේ සම්බන්ධ ශ්‍රී ලාංකීය සාධක විරල ය.

ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප අතරෙන් වැඩිම මූල ඓතිහාසික සාධක ප්‍රමාණයක් වියළි කලාපය නියෝජන කරයි. ඒ අනුව උතුරු, නැගෙනහිර, වයඹ, උතුරු මැද, ගිනිකොනදිග, දකුණ ආදී පළාත් නියෝජනය වන පරිදි මෙගලිතික සංස්කෘතිය ව්‍යාප්ත වී ඇත. මෙතෙක් සිදුකර ඇති පර්යේෂණ අනුව ස්ථාන



වැඩිම සාධක ප්‍රමාණයක් උතුරුමැද පළාතෙන් හා උතුරු පලාතෙන් අනාවරණය වී ඇත. ඒ අනුව මූල ඓතිහාසික අවධිය පිළිබඳ සාධක කන්තරෝදය, මාන්තායි, පොම්පරිප්පුව, කරම්බන්කුලම්, තම්මැන්නාගොඩැල්ල, ගුරුගල්හින්න, වඩිගවැව, කොක්ඇබේ, දිවුල්වැව, රාජාංගනය, අනුරාධපුර, තෙක්කම්, රබෑව, මච්චියාගම, ඉබ්බන්කටුව, තඹරව, පිංවැව, පොල්පිතිගම, කටුපොත, මැදවච්චිළිය ආදී ස්ථානවල හඳුනාගත හැකිය. වර්තමානයේ සිදුකළ පර්යේෂණ අනුව තෙත් කලාපයේ ද ස්ථාන කීපයකින් මෙගලිතික සුසාන අනාවරණය විය. රුවන්වැල්ල, අස්මඩල, පදවිගම්පොළ. නා උල, ඇළහැර වැනි ස්ථානයන් ඒ සඳහා නිදසුන් වශයෙන් හඳුන්වා දිය හැකි ය.

මෙම සුසාන ආකෘතියේ ම තවත් දිගුවක් වශයෙන් මැටි කුටීර සුසාන නමින් වර්ගයක් ද ශ්‍රී ලංකව තුළ ව්‍යාප්තව තිබේ. වර්ෂ 1953 දී දැරණියගල මෙම සුසාන වර්ගය හඳුන්වන ලද්දේ ටෙරාකොටා කුටීර සුසාන වශයෙනි.[12] එහෙත් නිමල් පෙරේරා ඒවා හඳුන්වා දෙනු ලැබුවේ **'මැටි කුටීර සුසාන'** යනුවෙනි.[13] එසේම මේවා පිළිබඳව නූතන පර්යේෂණයන් සිදුකළ සෝමදේව හා දිසානායක විසින් මැටි ඔරු සුසාන වශයෙන් ඒවා නම් කර තිබේ.[14]

මේවාහි ස්වභාවය වන්නේ මෙගලිතික සුසාන ගර්භවල මෙන් මානව අවශේෂයන් මිහිදන් කර ඇති අතර ඒවා පිළිස්සූ මැටි ඔරුවක් හෝ ඍජුකෝණාශ්‍රාකාර පෙට්ටියක් බඳු පස්වලින් සකස් කොට පුළුස්සා ගත් නිර්මාණයක ආදාහනයෙන් පසු අවශේෂ වූ මානවඅවශේෂ ආහාර ද්‍රව්‍ය හා මැටි වළං ආදිය සමග තැන්පත් කිරීම යි. තව ද වළං තුළ බහා ද මේවායෙහි දැන්පත් කිරීම සිදුකර තිබේ. පසුගිය දශකයේ මේ පිළිබඳ සිදුවූ පර්යේෂණයන් විවිධ වන අතර කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ පුරාවිදයා පශ්චාත් උපාධි ආයතනය මේ සම්බන්ධ පර්යේෂනයන්හි ප්‍රමුඛතාවයක් උසුල යි.

කලෝටුවාව, රංචාමඩම, නිකවලමුල්ල, හල්දුම්මුල්ල, කලුපහනවත්ත යන ස්ථානයන්ගෙන් මේ සම්බන්ධ සාධක හමුවී තිබේ. මේවාහි දාතමයන් වශයෙන් ක්‍රි.පූ. 2500 සිට ක්‍රි.ව. 350 දක්වා වූ කාල පරාශයක් ලැබී තිබේ. ඉහතින් දැක්වූ සාසානයන්ගෙන් කළුපහනවත්ත පැරණිම සුසානයට සාධක වන අතර දුම්මලසූරිය වඩාත් නවීනතම සුසානගර්ඵයට හිමිකම් කියනු ලැබේ.

මෙකී සාසාන වර්ගයන්ගෙන් ද කියවෙනුයේ මෙගලිතික සංස්කෘතියේ ම තවත් එක් සුසාන ගර්භ විධික්‍රමයක් බව හඳුනා ගත හැකි ය.

## නිගමනය

මෙගලිතික සංස්කෘතිය පිළිබඳ සාධක ලොව විවිධ රටවිලින් ලැබී තිබේ. ඒවා අතර ක්‍රි. පූ. 5000 සිට ක්‍රි. ව. 500 දක්වා වූ කාල පරාශයක් ඒවා නියෝජනය කරන බව දැක්විය හැකි ය. මේවායින් සංස්කෘතික අවධියට අවතීර්ණ වෙමින් පැවති දියුණු ජන කණ්ඩායමකගේ නිර්මාණ ලක්ෂණයන් හා සංකල්ප ප්‍රකාශයට පත්වන බව නිගමනය කළ හැකි ය. ඔවුන් සතුව පැවති අභිචාර විධි හා සංස්කෘතික ලක්ෂණයන් ද, තාක්ෂණික දියුණුව ද මැන ගැනීමට ඇති කැඩපත වන්නේ මෙකී සුසාන ආශ්‍රිත අවශේෂයන් හා ඒවා නිමවීමටගත් තාක්ෂණික ලක්ෂණයන් ය.

සුසාන වර්ග කිහිපයක් පහත දැක්වේ.





*Alignment* වර්ගය



*Cycolits* වර්ගය



***Stupa*** ක්‍රමය



*Dolmen* ක්‍රමය



*Cist* ක්‍රමය



*Menhir* ක්‍රමය



## ආන්තික සටහන්

1. Deraniyagala, S.U., The Prehistory of Sri Lanka, Vol.II, Department of Archaeological Survey, Government of Sri Lanka, 1992, p.718.
2. -ibid-
3. ලගමුව, ආරිය/මැන්ඩිස් තුසිත ඩී., ''මුල් ලෝහ භාවිතය හා යකඩ නිෂ්පාදනය'' ශ්‍රී ලාංකේය ඉතිහාසය, වෙළුම 1, විජේතුංග, ඩබ්.ඒම්.කේ. සංස්., සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 2012, පි.73
4. -එම- පි. 75.
5. Seneviratna, S., **"The Beginning of Metal Technology in Sri Lanka"**, *GramiyaThakshanaya*, Godagama Mangala Ed., Department of Cultural Affairs, Colombo, 1994, 14.
6. ලගමුව, ආරිය/මැන්ඩිස් තුසිත ඩී., ''මුල් ලෝහ භාවිතය හා යකඩ නිෂ්පාදනය'' ශ්‍රී ලාංකේය ඉතිහාසය, වෙළුම 1, විජේතුංග, ඩබ්.ඒම්.කේ. සංස්., සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 2012, පි. 75.
7. Deraniyagala, S.U., The Prehistory of Sri Lanka, Vol.II, Department of Archaeological sUurvey, Government of Sri Lanka, 1992, p.734.
8. විතානාච්චි, චන්දන රෝහණ., ''මූල ඓතිහාසික අවධිය'' ශ්‍රී ලාංකේය ඉතිහාසය, වෙළුම 1, විජේතුංග ඩබ්.ඒම්.කේ. සංස්., සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 2012, පි. 45.
9. එම, පි. 46.
10. එම, පි. 48.
11. -එම-
12. Deraniyagala P.E.P. "Ferro-lithic or early historic terracotta statuary and a cist from Ceylon", Spolia Zeylanica, Vol. 27, No I, Department of National Museum, Colombo, 1953, pp 137-138.
13. Perera, N. "Early historic clay cist graves at Kalotuwawa (Sri Lanka)", zeitschrift fur archaeologie Aussereuropaischer Kalturen, Germany, 2010, pp 65-70.
14. Somadeva, R., Archaeology of the Uwa Valawe Basin, Occasional Paper No. 02, (ed), J weerasinghe, Colombo 07, 2010.